26 පිටෙන්

හා අභ්‍යන්තර තුවාල ගැන, විශේෂයෙන්ම බරපතල පහරදීමකින් ඉළඇට බිඳී ඇති බවට දුන් වෛද්‍ය සහතිකය වගේ දේවල් උනත් හොඳටම ප්‍රමාණවත් මට දේශපාලන රැකවරණ ලැබෙන්න ”

මුලදී තරමක ආක්‍රමණශිලීභාවයක් ප්‍රකට කළ එම සහෝදරයා පසුව පසුතැවිලි වන්නාක් මෙන් මා දෙස බලා සිටියේය . මම ඔහුට මෙසේ ද පැවසිමි.

“කොහොම උනත් කමක් නෑ සහෝදරයා, මම පක්ෂයේ කෙනෙක් විදියට දේශපාලන රැකවරණ ඉල්ලපු එක ගැන මට සතුටුයි. ආඩම්බරයි. මොකද වෙන පක්ෂයක කෙනෙක් කියලා කියනවට වැඩිය තමන් ජනතා විමුක්ති පෙරමුනේ කෙනෙක් කියන එක ඕනෑම කෙනෙකුට ලොකු ගෞරවයක්. ඉතින් මටත් ඒ ගෞරවය ලබාගෙන O.F.P.R.A. එකේ සම්මුක සාකච්ඡාව තිබුන වේලාවේ පක්ෂයටත් ඒ ගෞරවය අරගෙන දුන්නා. ”

එදින සීත සෘතුවේ තරමක් සීතල අඩු දවසකි. වේලාව හැන්දෑවේ පහ පමණ වුවත් හාත්පස දුක්මුසු අඳුර විසින් වෙලා ගනිමින් පැවතිණ. කඩ, සාප්පු, අවන්හල් ආදී සෑම තැනකම විදුලි පහන් දැක්වෙයි. මහ මාවතේ දැල්වෙන විදුලි පහන්වලින් නික්මෙන්නේ කහ පැහැති මලානික එළියකි. එම එළිවටා මීදුමක් වැනි දුමාරයක් දැවටී තිබෙයි.

මගේ රටේ, ගමේ ගෙදර උන් කාලයේ ගොම්මන් අඳුර ගලාඑන හැන්දෑවක මතකය තුළ මම ගිලී යන්නෙමි. අඳුර ලොව වසා ගන්නට කලියෙන් තම කැදලි තුළ හෝ අතු පතරක ලැගුම් ගන්නට සූදනම් වෙන සියොතුනගේ හඬවල් අතරින් තියුණු ලෙස දෙසවන් පාරවන්නේ ගිරවුන්ගේ හඬය. පොල් කිච්චන් ජෝඩුවකගේ ශෝකී ගායනයක් ඇසෙන්නේ වතුසුද්ද පඳුර දෙසිනි. මහමුහුද පැත්තේ තානායම් හන්දියේ ඇති විසල් බෝරුකේ සිට පියඹා එන වවුලෝ කුෂ්ඨරාජගල පර්වතය ළඟම ඇති බෝරුක දෙසට පියඹා යති කොහුලණු ලැබැල්ලකින් ගැටගැසු හිස් ලාම්පුතෙල් බෝතලයක් අතේ එල්ලාගත් ජයවිකුම්ගම කොලුවෙකු කරුණෝ අයියාගේ කඩය දෙසට දිවයයි. නිවස ඉදිරිපස පඩිය උඩ වාඩි වී සිටින මට අද දවසත් ඉවර වුණා නේදොයි යන දෝමනස්සය දැනෙයි. ලංකාවේ මිනිසුන්ට ගොම්මනට පසු එළඹෙන රාත්‍රිය දවසේ දුක් කරදර අමතක කර නිදිසුව ලබාගැනිම සඳහා ය. ඇතැම් නිශාචර සතුන්ට මෙන්ම මේ එළඹෙන්නේ පැරිසියේ මිනිසුන්ගේ ජීවිතයට දවස උදාවන හෝරා ය.

‘බ්‍රෙගුඒ සැබැන්’ උමං දුම්රිය පොළේ උමං කට ළඟට වී මා බලාපොරොත්තු සිටින්නේ විශේෂ පුද්ගයෙකුගේ පැමිණි මය. ශ්‍රී ලංකා රජයට සේම ලංකාවේ ප්‍රවෘත්ති පත්‍රවලට ද ඔහු අති විශේෂ පුද්ගලයෙකි. මුණ ගැසීම සඳහා ඔහු මට වේලාව දී තිබුණේ සවස පහහමාරය. පහ හමාරට ළංවෙත්ම උමං දුම්රිය පොළේ උමං කටින් පිටතට දමන මිනිස් සේනාව අතර ඔහු සිටිදැයි දැන ගැනිමට මම විමසිලිමත් විමි.

මගේ පිටුපසින් පැමිණි කිසිවෙකු පිටට තට්ටු කලේය. මා තිගැස්සී ගියෙමි. පුන්සිරි සහෝදරයා, ඔහුට යාර කිහිපයක් නොදුරින් මා බලාපොරොත්තුව සිටි පුද්ගලයා අප වෙතට පැමිණෙමින් සිටියේය. සෝමවංශ අමරසිංහ සහෝදරයා.

අපගේ හමුවීම තරමක් හැඟුම්බර විය. මට ඔහු වැලඳ ගන්නට තරම් සෙනෙහසක් ඉපදිණ. ලංකාණ්ඩුවේ හමුදාවල විශේෂ ඒකකයන්හි මිනීමරු දඩබල්ලන්ට අසු වුවා නම් කීතු කිතු කර ඉරාදමන පක්ෂයේ නායක සොයුරෙකු මා ඉදිරිපිට ජීවමානය සිටින හැටි.

පුන්සිරි සහෝදරයා අපට ඉඩදී වෙනතක ගියේය. අප උමං දුම්රිය ස්ථානයේ උමං ද්වාරය ඉදිරිපට වූ අවහන්හලට ඇතුළු වීමු. දිගු කවුන්ටරය වටා තැබු කකුල් තුනේ උස පුටුවල වාඩි වූ මිනිසුන්ද හිටගෙන සිටින මිනිසුන්ද ලොකු වීදුරුවල පිරවූ බීර හා කුඩා කෝප්පවල දැමූ කෝපි බොමින් දුම් බොමින් සිටිති.

“ද්දු ” කෆේ සිල් ” වු ප්ලේ ” (කරුණාකර කෝපි දෙකක්)

මට පෙර ඉදිරියට ගිය අමරසිංහ සහෝදරයා කෝපි දෙකක් ඇණවුම් කළේය. එම මොහොතේම මා තේරුම් ගත්තේ ඔහු ප්‍රංශයට පැමින මඳ කලක් ගත වී ඇත බවය. මගේ එම නිගමනය නිවැරදි බව පසුව වැටහිණ. කෝපි කෝපප දෙකක් රැගෙන දුම් නොඋරන පැත්තට ගිය අප කුඩා රවුම් මේසයක් දෙපස හිඳ ගතිමි.

අප කොතරම් වේලාවක් සාකච්ඡා කලේදැයි නිනච්චක් නැත. මා පක්ෂයට යවන ලද ලියවිල්ල ඔහුට ලැබී තිබින. අප එහි සඳහන් වු කරුණු සාකච්ඡා සදහා යොදු ගතිමු.

පක්ෂය ජනතාව ස්වයං විවේචනයක් කළයුතු කියලා සහෝදරයා තදින්ම කියන්නේ ඇයි ? ස්වයං විවේචනයක් විතරක් නොවෙයි ඇගයීමක්ද කළ යුතුයි. රටේ ජනතාවට හොඳ සමාජ ක්‍රමයක් හදල දෙන්න අපේ සහෝදරවරු කොයිතරම් විශාල පරිත්‍යාග කළාද? රාජ්‍ය බලය ගන්න ඔන්න මෙන්න කියන තැනට අපි ආවා. රෝහන සහෝදරයා ඇතුළු නායකයන් සියලු දෙනාම වගේ ජීවිත පරිත්‍යාග කළා”

“ඇත්ත තමයි සහෝදරයා, ඇගයීමක් කළයුතු තමයි.”ඒකේ විවාදයක් නෑ. අපි හිතමු මෙහෙම, විද්‍යාඥයෝ පිරිසක් යම් වැදගත් දෙයක් සොයාගන්න විශේෂ පරීක්ෂණයක් කලා. අවසන් ප්‍රථිපලය දක්වා එන්න බැරිවුනා. එතකොට ඔවුන් අවධානයට ලක්කරන්නේ පරීක්ෂණයේ සාර්ථක වුන කොටස නෙවි. වැරදුනේ කොතැනද කියලා. මම කියනනේ රටේ ජනතාවට අපි අතින් සිද්ධ වුන සමහර වැරදිත්, අපට වැරදුන තැනුත් අධ්‍යායනය කරලා ජනතාවගෙන් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලමු. ජනතාව අපට සමාව දේවි. ආයේ දෙකක් නෑ ”

අමරසිංහ සහෝදරයා නැගු ප්‍රශ්නයකට මම එසේ පිළිතුරු දුන්නෙමි. “ඔව් ස්වයං විවේචනයක් කරන්න පුළුවන්. ඇගයීමක් සමඟ නමුත් හදිසියක් නෑ ”

අමරසිංහ සහෝදරයා තිරණාත්මක හඬකින් පැවසී ය. සමාජවාදය උදාකරලීම සදහා ආයුධ සන්නද්ධ අරගලය තවදුරටත් වලංගු ක්‍රමයක් නොවේයයි මා පැවසු විට මා දෙස බලා සිටියේ තියුණු දෙනෙතිනි.

“එහෙම නිගමනයකට එන්න තවම කල් වැඩියි. අපි ඒක පස්සේ සලකලා බලමු”

ඔහු පැවසුවේ බැරෑරුම් ලෙසය.

ළබන කළාපයට




